ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## <u>11 වන ජාත්‍යන්තර යෝගා දිනය කොළඹ දී උත්කර්ෂවත්ව සැමරේ</u>

කොළඹ, ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සහ එහි සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය ශ්‍රී ලංකා රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හා එක්ව 11 වන ජාත්‍යන්තර යෝගා දිනය 2025 ජුනි 21 වන දින කොළඹ නිදහස් චතුරස්‍රයේ දී මහත් උත්කර්ශවත් අයුරින් සමරන ලදී. මෙම වසරේ යෝගා දින තේමාව වන "මුළු ලොවෙහි මනා පැවැත්ම සහ අප සැමගේ නිරෝගීභාවය" යන්න මනුෂ්‍යයන් සහ ස්වභාව ධර්මය අතර සුසංයෝගීතාවය වැඩි දියුණු කිරීමෙහිලා යෝගා ව්‍යායාමයන්හි විශ්වීය අදාළත්වය අවධාරණය කරයි.

2. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා විද්‍යා සහ තාක්ෂණ අමාත්‍ය ආචාර්ය ක්‍රිෂාන්ත අබේසේන, කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කතානායක රිස්වි සාලි, ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කේ.පී. අරුණ ජයසේකර, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගමගෙදර දිසානායක, ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍ය සුගත් තිලකරත්න යන මහත්වරුන් ඇතුළු සම්භාවනීය අමුත්තන් සමඟ මෙම අවස්ථාවට සහභාගී විය.

3. අති පූජ්‍ය ආචාර්ය මාඉටිපේ විමලසාර නා හිමිපාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය සාමය සහ සුවතාවය සඳහා සිදුකළ ආශිර්වාදයකින් පසුව වැඩසටහන ආරම්භ විය. ඉන් අනතුරුව ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ යෝගා ප්‍රවීණයන් විසින් යෝගා සහ භාවනා සැසියක් පවත්වන ලදී. සුවතාවය සහ එක්සත්භාවය සඳහා කැපවීම පිළිඹිබු කරමින් සම්භාවනීය අමුත්තන්, සිසු සිසුවියන් ඇතුළු යෝගා සඳහා උනන්දුවක් දක්වන සිය ගණනක පිරිසක් මේ සඳහා සහභාගී වූහ. නියම යෝගා දැනුම වෙත ප්‍රවේශ වීමේ හැකියාව පුළුල් කරමින් විශේෂයෙන් සකස් කරන ලද යෝගා පෙන් ඩ්‍රයිවයක් සහ හත යෝගා ප්‍රදීපිකාවේ සිංහල පරිවර්තනය ද මෙහිදී එළි දක්වන ලදී. කොළඹ පැවති ප්‍රධාන සැමරුම හා සමගාමීව හම්බන්තොට සහ යාපනය ඉන්දියානු කොන්සියුලර් ජනරාල් කාර්යාල සහ මහනුවර සහකාර ඉන්දියානු මහ කොමසාරිස්

කාර්යාලය ද 11 වන ජාත්‍යන්තර යෝගා දිනය සඳහා දිවයින පුරා උනන්දුව පිළිඹිබු කරමින් විවිධ යෝගා වැඩසටහන් සංවිධානය කර තිබිණ.

4. යෝගා දිනය නිමිත්තෙන් සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් ශ්‍රී ලංකා රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ආයුර්වේද දෙපාර්තමේන්තුව සහ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් 2025 ජූනි 19 වන දින ශ්‍රී ලංකාවේ පළාත් නවයම ආවරණය කරමින් ආයුර්වේද රෝහල් 113ක සහ විශ්ව විද්‍යාල 4ක එකම වේලාවකදී යෝගා වැඩසටහන් පවත්වන ලදී. මෙයාකාරයෙන් දිවයින පුරා එකම වේලාවක දී යෝගා දිනය සමරන ලද්දේ පළමු වරට ය.

5. 2014 වසරේදී ඉන්දියාව විසින් කරනු ලැබූ යෝජනාවක් අනුව එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය සෑම වසරකම ජූනි 21 වන දින ජාත්‍යන්තර යෝගා දිනය ලෙස නම් කරන ලදී. ශ්‍රී ලංකාව මේ සඳහා සාඩම්බර සම සත්කාරකත්වය දැරූ අතර යෝජනාවට රටවල් 170ක සහය හිමි විය.

***

**කොළඹ**
***2025* ජූනි *21***